# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/38 - 2020 ඔක්තෝබර් මස 07 වැනි බදාදා - 2020.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට මහගාල්ල ජල සම්පාදන ක්‍රමය අදියර III යටතේ කුරුදුවත්ත ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටස අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5-2/GL/16



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 109A, ඉහළගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, ඉහළගොඩ - කුරුදුවත්ත ගමේ පිහිටි බුස්සේහෙනකන්ද නොහොත් පොකුණුගොඩවත්ත නමැති ඉඩමින් පර්චස් 30ක ප්‍රමාණයෙන් යුත් පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජයන්ති හන්දියේ සිට එන පාර ; |
| *නැගෙනහිරට* | : | රුහුණුගේ මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | රුහුණුගේ මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | රුහුණුගේ මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. සුගතදාස රුහුණුගේ මහතා,
"දීප්ති",
ගල්වැටවත්ත,
වලහන්දුව.

10 - 852

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට අළුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කොලේමෝදර ජල මූලාශ්‍ර ස්ථාන භාරකරු නිල නිවාසය ඉදිකිරීමට ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 02 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5-2/KT/18

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 815B, පහළගොඩ ග්‍රාම නිලධාරි වසමේ නාහල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සම්මත කළ අංක Ka/MAD/2019/743 හා 2020.01.21 දිනැති අනුරේඛනයේ කැබලි අංක 2 ලෙස දක්වෙන කොලේමෝදර ඕවිට නමැති හෙක්ටයාර් 0.0506 (පර්චස් 20) ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 01 හා මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | මාර්ගය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොලේමෝදර ඕවිට ; |
| *දකුණට* | : | හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොලේමෝදර ඕවිට ; |
| *බටහිරට* | : | කැබලි අංක 1. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : සොයාගත නොහැක

10 - 853

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට මහගාල්ල අදියර III ජල සම්පාදන ක්‍රමය යටතේ ජල තටාකයක් හා පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5-2/GL/20

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 155A, හියාරේ - දකුණ ග්‍රාම නිලධාරී වසමේ, හියාරේ ගමේ පිහිටි අශ්වත්ථාරාම විහාරස්ථානය අසළ පිහිටි සමගි පෙර පාසැල් ඉඩමට පිටුපස ඉඩමෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ග කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : ගරු විහාරාධිපති,
පූජ්‍ය කැටියපේ ඉන්දසුමණ හිමි,
අශ්වත්ථාරාමය - හියාරේ.

10 - 854

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තිය සඳහා ශුද්ධි පත්‍රය**

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම එකී මණ්ඩලයේ රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පවිත්‍රාගාරය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව පළකරන ලද අංක 2064/7 හා 2018.03.26 දිනැති ගැසට් පත්‍රයේ 1A පිටුවේ උපලේඛනයේ සඳහන් ගමේ නම මොරලිය ලෙස ද ග්‍රාම නිලධාරී වසමේ නම මාහල්ල ලෙසද සඳහන් වුවත් එම ගමේ නම මාහල්ල ලෙසද ග්‍රාම නිලධාරී වසමේ නම අංක 103A මොරලිය ලෙසද නිවැරදි කරනු ලබන බව මින් ප්‍රකාශ කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5/2/2/1329

10 - 855

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.